14-07-2016

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම 2016

## පෙරදිග සංගීතය

කාලය : පැය 2 යි

විභාග අංකය : ..............................................   7 ශ්‍රේණිය

### I කොටස

REFERENCE ONLY

- සියලු ම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සප්තකය තුළ ඇති ප්‍රකෘති සහ විකෘති ස්වර සංඛ්‍යාවේ එකතුව,
    (i) 10කි. (ii) 12කි. (iii) 7කි. (iv) 8කි.

02. සප්තකයේ ප්‍රභේද තුන පිළිවෙළින්,
    (i) මන්ද / මධ්‍ය / උච්ච වේ. (ii) උච්ච / මන්ද / මධ්‍ය වේ.
    (iii) මන්ද / උච්ච / මධ්‍ය වේ. (iv) උච්ච / මධ්‍ය / මන්ද වේ.

03. කෝමල ස්වරයක් හැඳින්වීම සඳහා ස්වරයට
    (i) උඩින් තිතක් තබයි. (ii) යටින් තිතක් තබයි.
    (iii) යටින් ඉරක් යොදයි. (iv) කිසිවක් නොයොදයි.

04. බටහිර සංගීතයේ sharp notes (ෂාප් නෝට්ස්) හැඳින්වීමට මෙම සංකේතය භාවිත වේ.
    (i) # (ii) 0 (iii) ♮ (iv) ♭

05. කෝමල ග, නි, යෙදෙන ස්වර ස්ථාපන ගීයකි.
    (i) කඳුපෙළ අතරේ (ii) බැතිනා සිරිපා
    (iii) මුනි සිරිපාදේ (iv) පොත පත කියවා

06. ස - රි ස / රි - ග රි / ග - ම ග / ප - ප - /
    මෙම ස්වර පාදය අයත් ස්වර ස්ථාපන ගීතය වන්නේ,
    (i) ඈත ඇඳි යළි මැතට පාවේ. (ii) ඈත හිමේ ගිරි මුදුනේ
    (iii) සවන පිනන ගීත මිහිර (iv) කඳු කඳු නැගෙනා

07. මාත්‍රා තුනෙන් තුනට ගැයෙන ගීතය කි.
    (i) ලංකා ලංකා (ii) සසර වසන තුරු
    (iii) දිය ගොඩ සැමතැන (iv) හෙළ ජාතික අභිමානේ

08. තනි තිතේ ප්‍රභේද

(i) 5කි. (ii) 4කි. (iii) 3කි. (iv) 2කි.

09. රත්නදීප ජන්මභූමි යන ගීතය,

(i) දේශාභිමානී ගීතය කි. (ii) ළමා ගීතය කි.

(iii) උපදේශාත්මක ගීතය කි. (iv) බැති ගිය කි.

10. පහත සඳහන් ගීත අතරින් නූර්ති ගියක් වන්නේ,

(i) "ලෝකෙන් උතුම් රට" ගීතය යි . (ii) "අඹ දඹ නාරං" ගීතය යි.

(iii) "ආදරේ ඇයි පොඩි හඳමාමේ" ගීතය යි. (iv) "දකුණ නැගෙනහිර" ගීතය යි.

■ හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

(උඩරට, හින්දුස්ථානි, කෝමල, දාත, මාත්‍රාව, පහතරට, විභාග)

11. ස්වර සප්තකය තුළ ....................................... ස්වර 4 කි.

12. දොංපි / පිගත යන බෙර පදයට සමාන ....................................... තාලය ධාධරා තාලයයි.

13. පැදියක් ගායනයේ දී එහි පළමු ....................................... මත ආඝාතය යෙදීම සමග්‍රහයයි.

14. මධ්‍ය ලය මෙන් දෙගුණයක් ....................................... ලය ලෙස හැඳින්වේ.

15. කෝලම් නාට්‍ය ....................................... ප්‍රදේශයේ ප්‍රචලිත ගැමි නාට්‍ය විශේෂයකි.

■ හරිනම් (√) ලකුණ ද, වැරදිනම් (x) ලකුණ ද යොදන්න.

16. "නොමඟ නොයන් පුතේ" ළමා ගියකි. ( )

17. "පොත පත කියවා" ස්වර ස්ථාපන ගියකි ( )

18. "දන්න වංහුං අප" නූර්ති ගියකි. ( )

19. "ඔන්න බබෝ ඇතින්නියා" රබන් කවියකි. ( )

20. "පාන්කිරිත්තා තක්කිට තරිකිට" දේශාභිමානී ගියකි. ( )

(ලකුණු 1x20=20)

## II කොටස

■ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03ක ට පමණක් පිළිතුරු සපයන්න.

01. කෝමල ග, නි ස්වර ස්ථාපන ගීතයක ගීත ස්වර ප්‍රස්තාරය ලියන්න. (ලකුණු 10)

02. (i) ස්වර පුවරුවක රූප සටහනක් අඳින්න. (ලකුණු 05)

(ii) එම රූප සටහන මත, ස්වර සප්තකයට අයත් ස්වර 12 නම් කරන්න. (ලකුණු 05)

03. ලය ප්‍රභේද සහ ගුහ ප්‍රභේද උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10)

04. (i) තනි තිතේ ප්‍රභේද නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉන් දෙකකට අයත් බෙරපද, තිත් සංඥා, මාත්‍රා සහිතව ප්‍රස්තාර කර අදාළ තිත නම් කරන්න. (ලකුණු 07)

05. දේශාභිමානී ගීත, ළමා ගීත, උපදේශාත්මක ගීත, නූර්ති ගීත යන ගීතවලින් ඔබ කැමති ගීතයක් සම්පූර්ණයෙන් ලියන්න. (ලකුණු 10)